# නාලන්දා විද්‍යාලය - කොළඹ 10
# 11 ශ්‍රේණිය
# ගණිතය
# දෙවන වාරය
# ඒකක පරීක්ෂණය

**16) ගුණෝත්තර ශ්‍රේඪි**

## I කොටස

1. පොදු අනුපාතය 2 සහ හයවන පදය 128 වන ගුණෝත්තර ශ්‍රේඪියේ පළමු පදය සොයන්න.
2. ගුණෝත්තර ශ්‍රේඪියක පොදු අනුපාතය 2 සහ පළමු පදය -2 වේ. මෙහි -256 වන්නේ කීවෙනි පදයද?
3. ගුණෝත්තර ශ්‍රේඪියක පළමු පදය 3 සහ පස්වන පදය 243 වේ. මෙම ශ්‍රේඪියේ පොදු අනුපාතය සොයන්න.
4. 40,20,10..... ගුණෝත්තර ශ්‍රේඪියේ 6 වන පදය සොයන්න.
5. පළමු පදය 8 සහ පොදු අනුපාතය 2 වන ගුණෝත්තර ශ්‍රේඪියේ 20 වන පදය 2හි බලයක් ලෙස දක්වන්න.
6. පහත ගුණෝත්තර ශ්‍රේඪියේ පොදු අනුපාතය සොයන්න.

   $\frac{1}{2}$ ,1, 2, 4…….
7. පළමු පදය $\frac{1}{8}$ සහ පොදු අනුපාතය 2 වන ගුණෝත්තර ශ්‍රේඪියේ 9 වන පදය සොයන්න.
8. 3,6,12,24....... යන ගුණෝත්තර ශ්‍රේඪියේ පළමු පද 6 හි එකතුව සොයන්න.
9. ගුණෝත්තර ශ්‍රේඪියක තුන්වන පදය සහ 4 වන පදය පිළිවෙලින් 63 සහ 189 වේ.
   i. පොදු අනුපාතය සොයන්න.
   ii. පළමු පදය සොයන්න.
10. පළමු පදය 3 සහ 4 වන 192 වන ගුණෝත්තර ශ්‍රේඪියක පොදු අනුපාතය සොයන්න.

## II කොටස

1. එක්තරා පාසි වර්ගයක් පළමු සතියේ ජලයේ $6m^2$ ක වැසි යන පරිදි වර්ධනය වේ. ඉන්පසු සෑම සතියකටම කලින් සතියේ ප්‍රමාණය මෙන් දෙගුණයක ප්‍රමාණයක් වැසි යන පරිදි වර්ධනය වේ. ගුණෝත්තර ශ්‍රේඪි පිළිබද දැනුම භාවිතයෙන් $192m^2$ ක ප්‍රමාණයක් වැසි යන්නේ කීවෙනි සතියේ දැයි සොයන්න.
2. ගුණෝත්තර ශ්‍රේඪියක 5 වන පදය 2 සහ 11 වන පදය 128 වේ.
   i. ඉහත ආකාරයේ ගුණෝත්තර ශ්‍රේඪි 2ක් පවතින බව පෙන්වන්න.
   ii. ඉහත ශ්‍රේඪි වල පළමු පද 4 බැගින් ලියන්න.
3. a) සංඛ්‍යා අනුක්‍රමණයක n වන පදය $2(3)^{n+1}$ වේ.
   i. ඉහත සංඛ්‍යා අනුක්‍රමණය ගුණෝත්තර ශ්‍රේඪියක් බව පෙන්වන්න.
   ii. මෙම ශ්‍රේඪියේ පළමු පදය සහ පොදු අනුපාතය සොයන්න.

   b) ගුණෝත්තර ශ්‍රේඪියක $T_1$, $T_2$ සහ $T_3$ පිළිවෙලින් $x$, $x^3$ සහ $x^5$. $\frac{T9}{T5}$ ගණනය කරන්න.

Type your text
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk